
# බ්‍රයන් සහ ස්නොවී



මිහිකා තිලක්ෂි දිසානායක

# බ්‍රයන් සහ ස්නෝවී




කතාව සහ චිත්‍ර

මිහිකා තිලක්ෂි දිසානායක



ප්‍රකාශනය

මහ/මහාමායා බාලිකා විද්‍යාලය

1 වන මුද්‍රණය

ISBN 978-624-208-472-5

2025/02/08

# පිදුම

නිතරම මා ළඟ හිඳිමින් මා දිරිමත් කරන හා මා

ඉල්ලන, හැකි සියලු දේ මට ලබාදෙන මගේ ආදර

අම්මාටත් අප්පච්චීටත්,

මට නිරතුරුවම උදව් කරන

මගේ අයියාටත් නංගීටත්,

මට අකුරු කියාදී මඟ පෙන්වූ මගේ ආදරණීය

අත්තම්මලා ලොකු අත්තලාටත්,

මට සෙවනැල්ලක් මෙන් සිට මා දිරිමත් කරන

මහාමායාවේ සියලුම ගුරුවර ගුරුවරියන්ටත්,

මා කුඩා කළ සිට මේ දක්වා පුංචිම දෙයකින් හෝ මට

සහාය වූ සියලුම දෙනාටත්,

මගේ ආදර මිතුරු මිතුරියන්ටත්

මාගේ මේ කුළුඳුල් ප්‍රයත්නය පිළිගන්වමි.

**මිහිකා තිලක්ෂි දිසානායක**

**2025/02/08**

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ජෙද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලිය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **“හෙරණගත්කරණී”** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජිවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

# බ්‍රයන් සහ ස්නොවී

එකෝමත් එක කාලෙක බ්‍රයන් කියලා පොඩි ළමයෙක් හිටියා. දවසක් බ්‍රයන් උදෙන්ම නැගිටලා ඉස්කෝලේ යන්න පිටත් වුණා.

ඉස්කෝලෙට යන පාරේ "බව්" "බව්" කියමින් චූටි බලු පැටියෙක් කෑ ගහ ගහ ඉන්නවා බ්‍රයන් දැක්කා. එයා සුදු පාටයි, හරිම ලස්සනයි. බ්‍රයන් හිමීට හිමීට බලු පැටියා ළඟට කිට්ටු වුණා. බලු පැටියා ඒක දැකලා බය වෙලා වේගයෙන් දුවලා ගිහින් පඳුරක් අස්සේ හැංගුණා.



"ඉස්කෝලෙට යන්න පරක්කු වුනොත් අම්මා බනියි"

බ්‍රයන් හිතුවා. ඒ නිසා එතන නැවතිලා බලු පැටියා

හොයන්නේ නැතුව බ්‍රයන් ඉස්කෝලෙට ගියා.

කොහොම හරි බ්‍රයන් සීනුව ගහන්න කලින්

ඉස්කෝලෙ ට ආවා.

සීනුව නාද වුණා. ළමයි හැමෝම හිටගත්තා. පන්සිල්

සමාදන්වෙලා ගුරුතුමියට "ආයුබෝවන්" කියලා

හැමෝම නැවතත් වාඩි වුණා. වෙනදා වගේම උදෑසන

පාඩම් පැවැත්වුණා. නොදැනීම විවේක කාලය ආවා.



බ්‍රයන් අද විවේක කාලයට ගෙනල්ල තියෙන්නේ බටර් ගාල සීනි දාපු පාන් කෑලි හතරක්. බ්‍රයන් බටර් සහ සීනි පාන් කන්න හරිම කැමතියි.

බ්‍රයන් පාන් කෑලි තුනක් කෑවා. අන්තිම කෑල්ල ඉතුරු කළා. විවේක වේලාවේ ඉතුරු ටික බ්‍රයන් යාළුවොත් එක්ක හොඳට සෙල්ලම් කරා.

සීනුව නාද වෙලා විවේක වේලාව ඉවර වුණා. දහවල් පාඩම් අවසාන වුණා,  දන්නෙම නැතුව ඉස්කෝලේ අවසාන වෙන වෙලාවත් ආවා. සුපුරුදු පරිදි දවසේ අවසාන ගාථා කීමෙන් පසු "ඉස්කෝලේ ඇරුණා" කියලා ගුරුතුමිය කිව්වා.

ළමයි හැමදෙනාම ගුරුතුමියට "තෙරුවන් සරණයි" කියලා කිව්වා.

ගුරුතුමියත් ළමයින්ට "බුදු සරණයි" කියලා කිව්වා.

බ්‍රයන් ඇවිදගෙන ගෙදර යන්න පටන් ගත්තා. මෙහෙම ඇවිදගෙන යනකොට උඩේ දැකපු බලු පැටියා හිටියා. බ්‍රයන් බෑග් එක ඇරලා කෑම පෙට්ටිය අතට ගත්තා. කෑම පෙට්ටියේ ඉතුරු වෙලා තිබ්බ අන්තිම පාන් කෑල්ල අරගෙන හිමීට හිමීට බලු පැටියා ළඟට ගියා.

බලු පැටියා ඉව කරමින් චුට්ට  චුට්ට බ්‍රයන් ළඟට කිට්ටු වුණා, හිමී ට පාන් කෑල්ල ඇරගෙන සතුටින් ඒක කෑවා.



බ්‍රයන්ට හරිම සතුටුයි. එදා ඉඳලා හැමදාම බ්‍රයන් එයාගේ දවල් කෑම වේලෙන් චුට්ටක් ඉතුරු කරගෙන බලු පැටියාට දුන්නා. බලු පැටියත් වැස්ස වුණත් අව්ව වුණත් හැමදාම බ්‍රයන් එනතුරු බලාගෙන හිටියා.

එදා නිවාඩු දවසක්, බ්‍රයන්ට එයාගේ බලු පැටියව මතක් වුණා. දුවගෙන අම්මා ළඟට ගිහිල්ලා බලු පැටියා ගැන විස්තරය කිව්වා.

"අනේ අම්මේ, අපි ඒ බලු පැටියාව ගෙදර ගේමු ද? එයාට ඉන්න තැනක් නෑනේ. එයා හරිම පව්, එයා හරිම හොඳයි." බ්‍රයන් අම්මාගෙන් ඇහුවා.

"බලු පැටියව ගෙදර ගේන්න නම් පුළුවන්, හැබැයි ඔයා එයාව තියාගන්නවනම් එයාව නාවන්න ඕනේ, ඇවිදින්න එකතු කරගෙන යන්න ඕනේ, එයාට නිදියන්න තැනක් හදලා දෙන්න ඕනේ, කෑම කන්න පිඟානක් වතුර බොන්න කෝප්පයක් දෙන්න ඕනේ. එයත් එක්ක සෙල්ලම් කරන්න ඕනේ. මේවා ඔක්කොම මගේ පුතාට කරන්න පුලුවන්ද?" අම්මා ඇහුවා.

"අම්මා බලු පැටියට කෑම ටික විතරක් හදලා දෙන්නකෝ මම ඉතුරු වැඩ ඔක්කොම කරන්නම් අම්මේ" බ්‍රයන් කිව්වා.

"හරි එහෙමනම් බලු පැටියව ගෙදර ගේන්නකෝ" අම්මා කිව්වා.



"බොහොම ස්තූතියි! අම්මේ, මගේ හොඳ අම්මා."

බ්‍රයන් දුවලා දුවලා ගිහින් බලු පැටියාව ගෙදර අරගෙන



ආවා. අපෝ හරිම ගඳයි. බ්‍රයන් බේසමක් හා වතුර කෝප්පයක් මිදුලට අරගෙන ආවා. සබන් ගෙනාවා. කෝප්පෙන් චුට්ට චුට්ට වතුර දාලා බලු පැටියාව සබන් ගාලා හොඳට නැහැව්වා.

අම්මා පිඟානකට බත් හා මස් මාළු අනලා දුන්නා. බලු පැටියා නැට්ට වනමින් සතුටින් බත් ටික කෑවා.

බ්‍රයන් එයාගේ කාමරේ පරණ වෙච්ච රෙදි කෑල්ලක් දාලා බලු පැටියට නිදාගන්න තැනක් හැදුවා. බලු පැටියා වේගයෙන් එතෙන්ට ගිහිල්ලා ගුලි වෙලා නිදාගත්තා. බ්‍රයන් වෙනද වගේම ඇඳේ නිදාගත්තා.

ඊළඟ දවසේ බ්‍රයන්ව අවදිකරේ බලු පැටියා. බලු පැටියා



බ්‍රයන්ගෙ මූණ ලෙවකාල තමා ඇහැරවලා තියෙන්නේ. බ්‍රයන් බලු පැටියා සමග මිදුලට දිව්වා, බෝලයක් අරගෙන ඈතට විසි කරා. බලු පැටියා දුවගෙන

ගිහින් බෝලය අල්ලා ගත්තා. බ්‍රයන් බලු පැටියත් එක්ක උදේ වරුවම සෙල්ලම් කළා.

අම්මා බ්‍රයන්ට කතා කළා. බ්‍රයන් බලු පැටියත් එක්ක කුස්සිය පැත්තට ගියා.

"ඇයි අම්මේ...?" බ්‍රයන් ඇහුවා.

"පුතේ අපි මේ බලු පැටියට තාම නමක් දැම්මේ නැහැ නේ" අම්මා කිව්වා.

"චූටි...." "නෑ නෑ"

"සුදූ...." "ඒකත් හොඳ නෑ"

"බූලා...." "හරි නෑ"

"ලකී...." "හ්ම්... නෑ...."

"බිංගෝ..." "මම ඒ නමට කැමති නෑ"

"මිකී..." "හොඳ නෑ අම්මා"

"ආහ්..! මම දන්නවා මොකක්ද හොඳ නම කියලා, බලු පැටියා සුදුම සුදුයිනේ අපි එයාට "ස්නොවී" කියමු." බ්‍රයන් කිව්වා.

"ආ ඒක නං හොඳයි." අම්මා කිව්වා.

බලු පැටියත් "බව් බව්" ගැවා.

"ඒකනේ බලු පැටියත් කැමතියි." අම්මා කිව්වා.

"අම්මේ දවල්ට කෑම හැදුවද?"

"ඔව් පුතේ හැදුවා."

"ස්නොවීටත් හැදුවද?" "ඔව් පුතේ ස්නොවීටත් හැදුවා."

බ්‍රයන් බලු පැටියට කොච්චර ආදරේද කියලා අම්මට තේරුණා. ස්නොවීත් ඒ වගේම බ්‍රයන්ට ආදරෙයි. හැමදාම බ්‍රයන් ඉස්කෝලේ ඇරිලා එනකං ඉස්සරහ පඩියේ බලාගෙන ඉන්නවා. බ්‍රයන් ගේ හඬ ඇහුන ගමන් මගට දුවගෙන යනවා. බ්‍රයන් ඉස්කෝලෙ යනකොටත් පිටිපස්සෙන් යනවා.

හැම වෙලාවෙම දෙන්නා එකටමයි ඉන්නේ.

එදා ඉඳලා මේ හොඳම යාළුවෝ දෙන්නා සතුටින් ජීවත් වුණා.

මේ දෙන්නා තමන් ගැන විතරක් නෙවෙයි, අනිත් අය ගැනත් බලනවා, උදව් කරනවා, ඒ වගේම හොඳ හොඳ වික්‍රමත් කරලා තියෙනවා.

එහෙනම් බ්‍රයන් සහ ස්නොවී ගේ වික්‍රමයන් සමග නැවත හමුවනතෙක් ආයුබෝවන්.



# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි  බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා  වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ  ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ  එකම ව්‍යාපෘතිය මෙයයි.
මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.
මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ  ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත්  සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන්  වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන්  ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දි තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්